Article 12 (1)


ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019 - 10 - 17 |

පැමිණිලිකාර පාර්ශවය : එස්. පී. කුමාර මයා.
55/2, ටී 85, මේඩ්ලන් පෙදෙස,
කොළඹ 07.

වගඋත්තරකාර පාර්ශවය : විදුහල්පති,
සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය,
කොළඹ 07.

පැමිණිලි අංකය : **HRC/4020/17**

පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-

පැමිණිලිකරු විසින් 2017-12-28 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, තම දරුවා ආසන්නතා පදනම මත ඉහත වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුළත් කිරීමේ අරමුණින් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇති බවත්, නමුත් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත්ය. . පැමිණිලිකරුට හිමිකම් ඔප්පුවක් නොමැති අතර, රජයේ ඉඩමක ස්ථිර පදිංචි වී සිටින බවත්, අනිකුත් සියලු ලේඛන ඇති බැවින්, තමාට අසාධාරණයක් සිදු කර ඇති බවත්, තම පුතුන් දෙදෙනා කොළඹ රාජකීය විද්‍යාලයේ දැනට ඉගෙනුම ලබන බවත්, එම පාසලට ආසන්නතා පදනම යටතේ ඉල්ලුම් කර ඇත්තේ ද මෙම ලිපිනයෙන් බවත් වැඩිදුරටත් දන්වා ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් දෙපාර්ශවයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පරීක්ෂණ කටයුතු පවත්වා ඇති අතර, වගඋත්තරකරු වෙනුවෙන් නියෝජ්‍ය




| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04. | | |
| දුරකථන / தொலைபேசி / Telephone | 94 -11- 2505580 / 81 / 82 | | |
| සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451 | ෆැක්ස් / தொலைநகல் / Fax | 011-2505541 / 74 |
| ලේකම් / செயலாளர் / Secretary | 011-2505521 | ක්ෂණික / துரித அழைப்பு / Hotline | 1996 |
| ඊමේල් / மின்னஞ்சல் / e-mail | sechrc@gmail.com | වෙබ් / இணையம் / Web | www.hrcsl.lk |

විදුහල්පතිනි පී.ආර්. කාරියවසම් මහත්මිය කරුණු දක්වමින් මෙම පැමිණිලිකරු පදිංචිය සනාථ කිරිම සඳහා ලිපිලේඛන ඉදිරිපත් කර නොමැත බවත්, කුටුම්බ කාඩ් පතෙහි පදිංචි අංකය හිමිකම සඳහන් වී නොමැති වීම නිසා ඔහු සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැති බවත් දන්වා ඇත. තවද මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශයට මෙම පැමිණිලිකරුගේ ලිපිගොනුව රැගෙන ගොස් පරීක්ෂා කර බලා 2018-05-22 වන දින නැවත පාසල වෙත ඒවා ඇති බවත්, ඒ සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් හෝ නිර්දේශයක් ලබා දී නොමැති බවත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-

පැමිණිලිකරු දීර්ඝකාලීනව මෙම ස්ථානයේ පදිංචි වී සිටින බවත්, හැඳුනුම්පත, විවාහ සහතිකය, ඡන්ද ලේඛනය, විදුලි බිල්පත්, දරුවාගේ උප්පැන්න සහතිකය සහ වෙනත් ලේඛන පවතින බවත් නිරීක්ෂණය වේ.

තවද 2017-07-31 දිනැති පාසල්වලට ළමුන් ඇතුලත් කර ගැනීමේ චක්‍රලේඛ අංක 22/2017 හි 7.1.3 යටතේ, "මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබාදෙන හෙයින් ලකුණු ලබා දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද, ලකුණු හිමිවන අනෙකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර, එවැනි අවස්ථාවල එම ගණය සඳහා සම්පූර්ණයෙන්ම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය" වශයෙන් දක්වා ඇත.

කෙසේ වෙතත්, නැවතත් 2017.07.01 දිනැතිව අංක 22/2017 (1) චක්‍රලේඛය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් සියලුම පාසල් විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති අතර, එම චක්‍රලේඛය අනුව ඉහත කී 22/2017 චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන්ම ඉවත් කර ඇති බවට දක්වා තිබීම හේතුවෙන් පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වූ අවස්ථාව වන විට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පැමිණිලිකරුගේ අයදුම්පත්‍රය සම්පූර්ණයෙන්ම ඉවත් කිරීමට නීතියෙන් අවස්ථාවක් ලැබී තිබූ බවට නිරීක්ෂණය වුවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2017.09.19 වන දින සියලුම පාසැල් වල විදුහල්පතිවරුන් වෙත නිකුත් කර ඇති ලිපියෙහි දෙවන ඡේදය කෙරෙහි අවධානය යොමු කිරීමේදී පළමුවන ශ්‍රේණියට ළමයින් ඇතුලත් කිරීමට අදාළ 2017-05-30 දිනැති 22/2017 චක්‍රලේඛය සම්බන්ධයෙන් විවිධ පාර්ශව වලින් තවදුරටත් ඉදිරිපත් වූ අදහස් හා යෝජනා අනුව එය 22/2017(1) චක්‍රලේඛනය මගින් සංශෝධනය සිදු කර ඇත. මෙම සංශෝධනය අනුව චක්‍රලේඛයේ 7.1.3 උප වගන්තිය ඉවත් කර ඇතත්, "එක් එක් ගණයක් යටතේ නිර්නායකයන්ට හිමිවන ලකුණු සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කළ යුතුය යන්න එමගින් ගම්‍ය නොවේ" වශයෙන් දක්වා ඇත. තවද එම ලිපියේ 3 වන ඡේදයට අනුව "22/2017 චක්‍රලේඛයේ අදාළ ගණයන් හය සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ගණයට අදාළ ලකුණු පටිපාටිය දක්වා

ඇත. යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාල ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණයෙන් ලකුණු ලබාදීම ප්‍රතික්ෂෙප නොකල යුතුය" යනුවෙන් දක්වා ඇත. පැමිණිලිකරු ආසන්නතා පදනම මත මූලික සුදුසුකම් සපුරා ඇත.

22/2017 චක්‍රලේඛයේ අදාල ගණයන් සඳහා මූලික සුදුසුකම් හඳුන්වා දීමෙන් අනතුරුව ඒ ඒ ගණයට අදාල ලකුණු පටිපාටිය දක්වා ඇත. "යම් අයදුම්කරුවෙකු එම මූලික සුදුසුකම් සපුරා නොමැති නම් පමණක් අදාල ගණයට හිමිකම් නොලබයි. එහෙත් නියමිත මූලික සුදුසුකම් සපුරා ඇත්නම් ලකුණු පටිපාටියේ එක් කොටසක් තහවුරු නොකිරීම මත සම්පූර්ණ ලකුණු ලබාදීම ප්‍රතික්ෂෙප නොකල යුතු බව" දන්වා ඇත. පහත නඩු තීන්දුහිදී එම කරුණ කෙරෙහි අවධානය යොමු කර අධිකරණයෙහි ස්ථාවරය වී ඇත්තේ, එක් නිර්ණායකයක් සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම මත අනෙක් නිර්ණායක සඳහා ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප කල නොහැකි බව සඳහන් කරමින් වෙනුර තත්විදු සහ එස්.ටී කොඩිතුවක්කු එරෙහිව බී.ඒ අබේරත්න, විදුහල්පති, කොළඹ රාජකීය විද්‍යාලය **SCFR Application No 62/2018** හි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීමට නොහැකි වීම පදනම් කරගෙන ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම තුළින් පෙත්සම්කරුට අසාධාරණයක් සහ 12(1) ව්‍යවස්ථාව... 

ගයනි ගීතිකා එරෙහිව දිසානායක **SCFR 35/2011** නඩු තීන්දුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාථ කිරීම අව්‍යාජයව ගොඩනැගීම සඳහා සම්මුච්තීය ප්‍රතිඵලයක් ලබාගැනීමට පළමු ශ්‍රේණිය සඳහා වූ අයදුම් පත්‍රය සමග ඉදිරිපත් කර ඇති ලේඛන සියල්ල සුපරික්ෂාකාරීව අධ්‍යයනය කළ යුතු බවයි.

පුෂ්පරාජන් රොහාන් එරෙහිව කාරියවසම් **SCFR 35/2011** නඩුවෙහි ප්‍රකාශ වූයේ පදිංචිය සනාත කිරීම සඳහා අවශ්‍ය ලේඛන අතරින් එක් ලේඛනයක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වූ පමණින් ඒ මත ඉතිරි නිර්ණායක සඳහා ලකුණු ලබා නොදීමට පාසල ගත් තීරණය අත්තනෝමතික තීරණයක් බවයි.

එසේම විශේෂයෙන්ම පාසලට ආසන්න පදිංචිකරුවන්ගේ ගණය යටතේ දරුවන්ගේ මූලික සුදුසුකම වනුයේ පෝෂිත ප්‍රදේශය තුළ පදිංචි වී සිටීමය. පදිංචිය තහවුරු කරන ලේඛන යටතේ වන පදිංචි ස්ථානයේ හිමිකම යන්න ලකුණු පටිපාටියේ අන්තර්ගත එක් නිර්නායකයක් පමණක් බව දන්වා ඇත.

ඒ අනුව පැමිණිලිකරු ආසන්නතා පදනම මත ඉල්ලුම් කර ඇති අතර, පැමිණිලිකරුට ඡන්ද හිමි නාමලේඛනයට ලකුණු 35ක්ද, අතිරේක ලේඛන සඳහා ලකුණු 05ක්ද, පාසලට ආසන්නතාවය වෙනුවෙන් ලකුණු 50ක්ද, හිමි වන බව නිරීක්ෂණය වේ. නමුත් සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයට ඇතුළත් කර ගැනීමට මෙම පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණයට කැඳවා නොමැත. ඒ අනුව මෙම පැමිණිලිකරු මෙම විද්‍යාලයේ සම්මුඛ පරීක්ෂණයට හා අභියාචනා මණ්ඩලයට සහභාගී වී මූලික සුදුසුකම් මත ලකුණු ලැබීමට හිමිකමක් ඇති බව නිරීක්ෂණය වේ.

ආසන්නතා ගණය සම්බන්ධයෙන් චක්‍රලේඛය තුළ ඉතා නිවැරදිව අර්ථකතනය කොට ඇති අතර, ආසන්නතා ගණය යටතේ දරුවන් ඇතුළත් කර ගත යුත්තේ කුමන ආකාරයෙන්ද යන්න නිවැරදිව දක්වා ඇත. චක්‍රලේඛයේ ඇතුළත් නිර්නායකයන් යටතේ ඉතා නිවැරදිව ආසන්න පදිංචිකරුවන් කවුරුන්ද යන්න හඳුනා ගැනීමට නිත්‍යානුකූල හැකියාව තිබියදී සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හා අභියාචනා මණ්ඩලය මෙම පැමිණිලිකරු පිළිබඳව සලකා බලා නොමැති බව නිරීක්ෂණය වේ.

**නිගමනය =:**

වගඋත්තරකාර පාර්ශවය අදාළ චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකර අත්තනෝමතික ක්‍රමවේදයක් අනුගමනය කිරීම තුළින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) ව්‍යවස්ථාව මගින් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇති බවට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව පැමිණිලිකරුගේ දරුවා වන නෙසදි බිමන්සා දරුවාට වගඋත්තරකාර විද්‍යාලයේ 2018 වර්ෂයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට අදාළ සම්මුඛ පරීක්ෂණය ප්‍රකාරව ලකුණු ලබා දීම සිදු කළ යුතු බවටත්, ඒ අනුව පැමිණිලිකරු කඩයිම් ලකුණු සීමාව කරා ප්‍රවිෂ්ඨ වන්නේ නම් පැමිණිලිකරුගේ දරුවා 2019 වසරේ දෙවන ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට කටයුතු කළයුතු බවටත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2019 . 11 . 29 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :-

1. ලේකම්,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ගරු අමාත්‍යතුමා,
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

B/